**ෆ්‍රෙඩා කොරයා සම්මාන 2022**

***තේමාව - වර්තමාන දිරිය කාන්තාවන්***

පසුගිය වසර 3 - 5 තුළ ශ්‍රී ලංකාවේ ඇතැම් කාන්තාවන් විවිධ අභියෝග ජයගනිමින් මීට පෙර ලබා නොගත් සාර්ථකත්වයක් ලබා ඇත. ඔවුන්ගේ එම උත්සාහයන් සඳහා වටිනාකමක් ලබා දීමට ගාමණී කොරයා පදනම තීරණය කර ඇත. ඔවුන් ලබා දුන් දායකත්වය පහත දැක්වෙන කරුණු යටතේ අගයනු ලැබේ:

පවුල් විමුක්තිය - ඔවුන්ගේ පවුලේ සමාජ තත්ත්වය ඉහල නැංවීම,

ව්‍යවසායකත්වය - රටේ ආර්ථික සංවර්ධනය සඳහා ඔවුන්ගේ දායකත්වය

**පවුල් විමුක්තිය**

මෙම කාණ්ඩයට අයත් වන්නේ වර්තමානයේ විවිධ දුෂ්කරතාවලට මුහුණ දුන් සහ විශාල අභියෝග ජයගත් මෙන්ම අන් අය සමග බෙදා ගැනීමට සාර්ථක කතාවක් ඇති වර්තමාන ගෘහනියන් ය. එම අභියෝග අතර ඔවුන් විඳදරාගත් සමාජ-ආර්ථික දුෂ්කරතා, වෛද්‍ය ගැටලු, පුද්ගලික ඛේදවාචක, වෙනස්කම් කොට සැළකීම් හෝ පාරිසරික අභියෝග ඇතුළු විවිධාකාර ගැටළු තිබිය හැකිය.

**ව්‍යවසායකත්වය**

මෙම කාණ්ඩය යටතේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක (SME) අංශය පිළිබඳ ප්‍රධාන අවධානය යොමු කෙරේ. මෙහිදී ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඉහළ මට්ටම් කරා ළඟා වූ කාන්තාවන් කෙරෙහි අවධානය යොමු කරනු ඇත. අවම මූලධන ආයෝජනයකින් ආරම්භ කර නිෂ්පාදන, ව්‍යාපාර ඥානය, රැකියා අවස්ථා ඇති කිරීම, විදේශ විනිමය ආදායම් ඉපයීම, පරිසර හිතකාමීත්වය සහ නව්‍යතාවය යන අංශවලින් ඉහළම ස්ථානයකට ළඟා වීමට සමත් වූ වර්තමාන ව්‍යවසායකයින් හඳුනා ගැනීමට මෙම අංශය උත්සාහ කරනු ඇත.

**සුවිශේෂී ජයග්‍රහණ - කීර්තිය සහ ගෝලීය පිළිගැනීම ආකර්ෂණය කර ගැනීම**

මෙම කාණ්ඩයට විද්‍යාව, තාක්‍ෂණය, ක්‍රීඩා, කලා, ආරක්‍ෂක, අධ්‍යාපනය හෝ පවුල් විමුක්තිය හෝ ව්‍යවසායකත්වය යන කාණ්ඩ යටතේ නොවැටෙන වෙනත් කැපී පෙනෙන ක්‍ෂේත්‍රවල විශිෂ්ටත්වය දැක්වූ අය කෙරෙහි අවධානය යොමු කරනු ඇත. කීර්තිය, බාධක මැඩගෙන ලබාගත් ජාත්‍යන්තර පිළිගැනීම මෙම කොටසේ අවධානයට ලක්වේ.

රටේ සංවර්ධන කටයුතුවලදී මෙන්ම පවුල්වල ජීවන තත්ත්වය සහ සමාජ තත්ත්වය ඉහළ නංවාලීම සඳහා ද කාන්තාවන් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. වර්තමාන තත්ත්වයන් තුළ, කාන්තා මූලික නිවාසවල වැඩිවීමක් දක්නට ලැබේ. පවුලේ අවශ්‍යතා සපුරාලීමේ බර කාන්තාවන් විසින් උසුලන අතර, දරුවන් රැකබලා ගැනීම සහ නිවසේ සියලු රාජකාරි ඉටු කිරීම ද ඔවුන් විසින් සිදු කරනු ලැබේ. මෙම අභියෝගවලට මුහුණ දෙමින් ජයග්‍රාහිකාවන් බවට පත්වන ආකාරය පිළිබඳ කාන්තාවන්ගේ කථාන්දර ඊට සමාන අභියෝගවලට මුහුණ දෙන අන් අයට දිරියක් වනු නොඅනුමානය. ඊට අමතරව, පොදුවේ සමාජයේ වැඩි දියුණුව සඳහා අනාගත ප්‍රතිපත්ති සකස් කිරීමේදී ප්‍රතිපත්ති සාදන්නන්ට ප්‍රයෝජනවත් මග පෙන්වීමක් එම අත්දැකීම් තුළින් ලබා දිය හැකිය.

**කථාන්තර රචකයින් සඳහා තරඟයක්**

ෆ්‍රෙඩා කොරයා සම්මාන 2022 කතන්දර රචකයන් සඳහා වන තරඟයක් ලෙස ද සැළසුම් කර ඇත. මෙම තරඟය ශ්‍රී ලංකාවේ ලේඛකයින් සඳහා විවෘත වන අතර ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂාවන්ගෙන් අයදුම්පත් භාරගනු ලැබේ. කෙසේ වෙතත්, සිංහල හෝ දෙමළ භාෂාවෙන් ලියන අයට ඔවුන්ගේ කථා වල ඉංග්‍රීසි පරිවර්තනයක් ලබා දිය යුතුය. වයස් හෝ වෙනත් කරුණු නොසලකා ශ්‍රී ලංකාවේ සියලුම පුරවැසියන් සඳහා තරඟය විවෘත වේ. විශ්‍රාමික ලේඛකයින් ද සාදරයෙන් පිළිගනිමු.

කතන්දර රචකයන්ගේ ප්‍රධාන කාර්යය වන්නේ සාර්ථකත්වය අන් අයට දිරියක් වන කාන්තාවන් හඳුනා ගැනීමයි. ඔවුන් සමඟ පුද්ගලික අදහස් හුවමාරුවක් තුළින් ලේඛකයන් කාන්තාවන් මුහුණ දුන් අභියෝග හඳුනාගෙන එම අභියෝග ජයගත් ආකාරය හෙළිදරව් කළ යුතුයි. ප්‍රෞඩා කොරියා සම්මාන 2022, කතන්දර ඉදිරිපත් කරන ලේඛකයින්ට සහ දිරිය කාන්තාවන්ට ආකර්ශනීය ත්‍යාග පිරිනමනු ඇත.

**ත්‍යාග**

පහත දැක්වෙන පරිදි එක් එක් කාණ්ඩයේ පළමු, දෙවන සහ තෙවන හොඳම කතාන්දර සඳහා තෝරාගත් කාන්තා සම්මානලාභීන්ට මෙන්ම ලේඛකයින්ට රන්, රිදී සහ ලෝකඩ සම්මාන පිරිනැමේ.

| **සම්මානය** | **පවුල් විමුක්තිය** | | **ව්‍යවසායකත්වය** | | **සුවිශේෂී ජයග්‍රහණ** | |
|---|---|---|---|---|---|---|
| | **සම්මානලාභියා** | **රචකයා** | **සම්මානලාභියා** | **රචකයා** | **සම්මානලාභියා** | **රචකයා** |
| රන් | රු. 750,000 | රු. 500,000 | රු. 750,000 | රු. 500,000 | රු. 750,000 | රු. 500,000 |
| රිදී | රු. 500,000 | රු. 300,000 | රු. 500,000 | රු. 300,000 | රු. 500,000 | රු. 300,000 |
| ලෝකඩ | රු. 250,000 | රු. 200,000 | රු. 250,000 | රු. 200,000 | රු. 250,000 | රු. 200,000 |

ප්‍රෞඩා කොරයා සම්මාන උළෙල අනෙකුත් දිරිය කාන්තාවන් සමඟ බෙදා ගැනීමට තරම් ප්‍රබෝධමත් කථා නිර්මාණය කළ හැකි වර්තමාන කාන්තාවන් ඉලක්ක කරන වාර්ෂික උත්සවයක් වනු ඇත.

**තරඟ නියමයන් සහ කොන්දේසි**

1. කතන්දර ඉංග්‍රීසියෙන්, සිංහලෙන් හෝ දෙමළෙන් ඉදිරිපත් කළ හැක.

2. ඉදිරිපත් කරන ලද සියලුම කථා, රචකයාගේ මුල් කෘති විය යුතුය.

3. ලේඛකයා අදාළ සම්මානලාභිනයගේ කතාව ලිවීමටත්, ඊට අදාළ ලිඛිත අනුමැතිය කතාව සමඟ ඉදිරිපත් කිරීමටත් ඇගේ අනුමැතිය ලිඛිතව ලබා ගත යුතුය. සියලුම ඉදිරිපත් කිරීම් අදාළ සම්මානලාභියා මෙන්ම ප්‍රදේශයේ පිළිගත් අධිකාරියක් විසින් අත්සන් කර තහවුරු කළ යුතුය. උදා: ග්‍රාම සේවා නිලධාරි, අදාළ ප්‍රදේශයේ පාසලේ විදුහල්පති ආදී.

4. තරඟයට ඇතුල්වීම සඳහා කරනු ලබන සියළු ඉදිරිපත් කිරීම්, එසේ කළ අවස්ථාවේ සිට ගාමනී කොරයා පදනමේ දේපල වන්නේය.

5. ගාමනී කොරයා පදනමේ-ප්‍රෞඩා කොරයා සම්මාන 2022 ට අදාළ කණ්ඩායමක් පැමිණ ලිඛිතව ඉදිරිපත් කර ඇති තොරතුරු වල සත්‍ය අසත්‍යතාවය පරීක්ෂා කිරීමෙන් පසු ලැයිස්තුගත අපේක්ෂකයින්ගේ සත්‍යතාව තහවුරු කෙරේ.

6. ජයග්‍රාහකයින් සම්බන්ධයෙන් ඇගයීම් කමිටුවේ තීරණය අවසාන තීරණය වන අතර ඊට අභියෝග කළ නොහැක.

7. මෙම කාර්යයේ ප්‍රතිඵලයක් වශයෙන් කිසිවෙකුට සිදුවන අලාභ හෝ හානි සම්බන්ධයෙන් ගාමණී කොරයා පදනමට වගකීමක් දැරිය නොහැක.

1. අපේක්ෂිත සම්මානලාභියාගේ අයදුම්පතේ / ලිපියේ පහත තොරතුරු ඇතුළත් විය යුතුය.

- අපේක්ෂිත සම්මානලාභියාගේ සම්පූර්ණ නම
- දුරකතන අංකය
- හැඳුනුම්පත් අංකය
- තැපැල් ලිපිනය
- විද්‍යුත් තැපැල් (ඊමේල්) ලිපිනය
- ඩිජිටල් ඡායාරූපය
- අත්සන

2. අදාළ පුද්ගලයා/පුද්ගලයන් ඇමතීමෙන් සහ ඔවුන් පිළිබඳ විමසා බැලීමකින් පසුව ඔවුන් විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු වල සත්‍යතාව ස්වාධීනව නැවත පරීක්ෂා කරනු ලැබේ.

3. ලියනු ලබන කතන්දර පහත අවශ්‍යතාවලට අනුකූල විය යුතුය: (භාෂා තුනම සඳහා පොදුය)

- වචන 1000 - 1500 අතර විය යුතුය
- ලේඛකයින්ට ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ භාෂාවෙන් කථා ඉදිරිපත් කළ හැකිය. කෙසේ වෙතත්, සිංහල සහ දෙමළ භාෂාවෙන් ලියා ඇති කථා වල ඉංග්‍රීසි පරිවර්තනයක් ලේඛකයා විසින් ලබා දිය යුතුය.
- කතන්දර 12 අකුරු ප්‍රමාණයෙන් 'Word' භාවිතයෙන් ඉදිරිපත් කළ යුතුය
- කතාවට මනා අර්ථ දැක්වීමක් සහිත ආරම්භයක්, ප්‍රධානාංග සහ අවසානයක් තිබිය යුතුය.
- පහසුවෙන් අවබෝධ කර ගත හැකි පැහැදිලි සංක්ෂිප්ත භාෂාවකින් කතා ලිවිය යුතුය.
- සෑම වාක්‍යයක්ම පේළි තුනකට වඩා දිගු නොවිය යුතුය.
- එක් කතාවක අවධානය යොමු කළ යුත්තේ එක් දිරිය කාන්තාවක් සම්බන්ධයෙන් පමණි.
- කතන්දර ලිවීම සඳහා ලේඛකයෙකුට අදාළ කාණ්ඩ තුනෙන් කාණ්ඩ එකක්, දෙකක් හෝ කාණ්ඩ තුනම තෝරාගත හැක.
- ලේඛකයකුට ලිවිය හැක්කේ එක් කාණ්ඩයකට එක් කතාවක් බැගින් පමණි.
- කතාවේ හිමිකරු විසින් තහවුරු කරන ලද කරුණු මත කතාව පදනම් විය යුතුය.
- කතාව ලියා ඇති පුද්ගලයාට අදාළ විස්තර සහ පසුබිම් තොරතුරු කතුවරුන් විසින් පහත සඳහන් විවිධ මාතෘකා යටතේ, කතාවට අමතරව, සැපයිය යුතුය.

**පවුල් විමුක්තිය**

**පවුල් පසුබිම:**

සැමියාගේ, දරුවන්ගේ සහ අනෙකුත් යැපෙන්නන්ගේ විස්තර:

**වාසස්ථානය:**

වාසස්ථානයේ හිමිකාරිත්වය සහ තත්ත්වය. වැසිකිලි ජල සැපයුම ආදී පහසුකම්.

අවට පරිසරය - ආසන්නයේ ජීවත් වන මිනිසුන්ගේ බලපෑම්.

අධ්‍යාපනික මට්ටම

ආදායම් මාර්ග

ගමන් බිමන් සම්බන්ධයෙන් වූ සීමාකම් - ගමන් සඳහා ඇති පහසුකම්

පාරිසරික තර්ජන වලට නිරාවරණය වීම - සතුන් සහ ස්වභාවික විපත්.

රාජ්‍ය ආයතනවල කාර්යභාරය:

ඔවුන්ට සමෘද්ධි ප්‍රතිලාභ, ත්‍රිපෝෂ ලැබේද යන්න.

වෛද්‍ය පහසුකම් ආදිය සඳහා ඇති පහසුකම්

**ව්‍යවසායකත්වය**

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (ව්‍යාපාර)

ඇතුලත්වන්නන්ගේ ප්‍රාග්ධන ආයෝජනය මිලියන 10 ට වඩා අඩු විය යුතුය.

ප්‍රාග්ධනය ලබා ගැනීමට ඇති අවස්ථා සහ හැකියාව:

ප්‍රාග්ධනය රැස් කිරීමට ඇති හැකියාව. පවුල් පසුබිම සහ මිතුරු කවය.

වෙළඳපල දැනුම.

අධ්‍යාපනික පසුබිම.

රාජ්‍ය ආයතන සමඟ ගනුදෙනු කිරීමේ හැකියාව.

**සුවිශේෂී ජයග්‍රහණ**

ආදායම්:

පවුලේ සාමූහික ස්ථිර මාසික ආදායම රුපියල් 100,000/-ට අඩු විය යුතුය.

**පිළිගත් ජයග්‍රහණ:**

පහත දැක්වෙන තොරතුරු ඉදිරිපත් කරනු ලබන එක් එක් අයදුම්පත්‍රයේ ඉහළ දකුණු කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය

- ලේඛකයාගේ සම්පූර්ණ නම
- කතාව ලියා ඇති අපේක්ෂිත සම්මානලාභියාගේ සම්පූර්ණ නම.
- අදාළ කාණ්ඩය, උදා. පවුල් විමුක්තිය.
- ලේඛකයාගේ හැඳුනුම්පත් අංකය
- ලේඛකයාගේ ඩිජිටල් ඡායාරූපය

සෑම අයදුම්පතකම පහත සහතිකය අමුණා තිබිය යුතු අතර ලේඛකයා සහ අපේක්ෂිත සම්මානලාභියා විසින් අත්සන් කළ යුතුය.

4. ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය සහ නිවැරදි බව මෙයින් ප්‍රකාශ කරමි. මා තෝරා ගනු ලැබුවහොත්, 2022 ෆ්‍රෙඩා කොරියා සම්මාන උළෙලේ නීති සහ රෙගුලාසිවලට යටත් වීමට මම එකඟ වන අතර

ඇගයීම් කමිටුවේ තීන්දුව අවසාන වශයෙන් පිළිගන්නා අතර ඔවුන්ගේ විනිශ්චයට අවනත වන අතර ඊට අභියෝග නොකරමි.

5. ඉහත සහතිකය අත්සන් කර දිනය ද සඳහන් කර තිබිය යුතුය.

සියලුම කථා විද්‍යුත් තැපෑලෙන් මෙම ලිපිනයට Secretary@gamanicoreafoundation.lk ඉදිරිපත් කළ යුතුය.

**කතන්දර ලිවීමේදී අනුගමනය කළ යුතු පියවර**

1. පසුගිය වසර 03 - 05 කාලය තුළ ජයගත නොහැකි ලෙස පෙනෙන අභියෝග සහ බාධක ජය ගනිමින් කැපී පෙනෙන සාර්ථකත්වයක් අත්කරගත් කාන්තාවක් හඳුනා ගන්න.

2. ලියනු ලබන කතා අන් අයට දිරියක් වන කාන්තාවන් පිළිබඳව විය යුතුය.

3. කාන්තාව සහ ඇයගේ ජයග්‍රහණ සම්බන්ධයෙන් අදාළ පසුබිම් තොරතුරු පැහැදිලිව ප්‍රකාශ කළ යුතුය.

4. කාන්තාව මුහුණ දෙන අභියෝග සහ බාධාවන් හඳුනාගෙන පැහැදිලිව විස්තර කළ යුතුය.

5. අභියෝග හා බාධක ජය ගැනීමට කාන්තාවන් අනුගමනය කරන උපාය මාර්ග සහ ක්‍රම ඔවුන් සමග පුද්ගලික සංවාදයෙන් ලබා ගත යුතුය.

6. ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ මග පෙන්වීම සඳහා මෙම දිරි ගන්වන කථා තුළින් උගත් පාඩම් ඉස්මතු කළ යුතුය.

ගාමිණී කොරයා පදනම විසින් මේ සඳහා පිහිටුවා ඇති ඇගයුම් කමිටුවක් මගින් කතන්දරවල අන්තර්ගතය සහ ගුණාත්මකභාවය පරීක්ෂාවට භාජනය කරනු ලැබේ. ඒ මත පදනම් වූ ලකුණු ලබා දීමේ ක්‍රමයක් තුළින් සිදුවන තේරීම් ක්‍රියාවලියක් හරහා ජයග්‍රාහකයින් තෝරා ගනු ලැබේ.

ඇගයීම් කමිටුව විසින් ලේඛකයින් සඳහා මාර්ගෝපදේශ සකසනු ලැබේ. මාර්ගගත ලෙස ලේඛකයින් ලියාපදිංචි වීමෙන් පසු විද්‍යුත් තැපෑලෙන් ඔවුන්ට මාර්ගෝපදේශ ලබා දෙනු ඇත.

ලියාපදිංචි කිරීමේ ආකෘති පත්‍ර https://gamanicoreafoundation.lk/fca2022/ වෙතින් බාගත හැකිය.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද මාර්ගගත ලියාපදිංචි කිරීමේ පෝර්ම 2022 නොවැම්බර් 20 වන දින අයදුම්පත් අවසන් වන දිනට පෙර ඉදිරිපත් කළ යුතුය.

**ලියාපදිංචි කිරීම**

තරඟයට ඇතුළත් වීමට කරුණාකර පහත දැක්වෙන ලියාපදිංචි කිරීමේ පෝර්මය පුරවන්න.

ලියාපදිංචියෙන් පසු, ඔබේ ලියාපදිංචිය පිළිගත් බවට විද්‍යුත් තැපැල් පණිවිඩයක් සහ අදාළ ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් සහ නියමිත කාලසීමාවන් ඔබ වෙත එවනු ලැබේ.